
# 10 ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳව කතා කිරීමේ දී බ්‍රිතාන්‍ය ජාතිකයකු වූ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් අමතක කළ නො හැකි විද්වතෙකි. අපේ රටේ වර්තමාන විශ්වවිද්‍යාල පද්ධතිය ආරම්භ කිරීමෙහි පුරෝගාමියා ඔහු ය. එතුමාගේ විශිෂ්ට මෙහෙවර සාකච්ඡාවට බඳුන් කෙරෙන මෙම ලිපිය මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස විසින් සම්පාදනය කරන ලද්දකි.





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි නිර්මාතෘවරයා ලෙස හැඳින්විය යුතු ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතා බ්‍රිතාන්‍ය ජාතිකයෙකි. ඔහුගේ පුරෝගාමිත්වයෙන් 1942 දී කොළඹ දී පිහිටුවන ලදුව පසුව 1952 දී පේරාදෙණියට ගෙන යන ලද ලංකා විශ්වවිද්‍යාලය අප දිවයිනේ පිහිටුවන ලද පළමු නූතන විශ්වවිද්‍යාලය වේ.

දෙවැනිව ජෙනිංග්ස් මහතා ශ්‍රී ලංකාවට තවත් වැදගත් මෙහෙවරක් ඉටු කළේ ය. එනම් 1948 ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් මිදී නිදහස ලබන විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මෙරටට සම්පාදනය කර දීම යි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ නූතන විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ කටයුත්ත දශක ගණනාවක් තිස්සේ දේශීය විද්වතුන් විසින් කරන ලද උද්ඝෝෂණයන්හි ප්‍රතිඵලයක් විය. වර්ෂ 1815 දී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට නතු වීමෙන් පසුව මෙහි පැතිරුණු ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ ඇතැම්හු මහා බ්‍රිතාන්‍යයෙන් සහ වෙනත් විදේශීය රටවලින් උපාධි ලබා මෙරට ද විශ්වවිද්‍යාලයක් පිහිටුවා ලිය යුතු යැයි යටත් විජිත පාලකයන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළෝ ය. ලංකාවේ විශ්වවිද්‍යාලයක් පිහිටුවා ගැනීමේ අරමුණින් 1904 දී ලංකා විශ්වවිද්‍යාල සංගමය නමින් සංවිධානයක් ද පිහිටුවා ගැනුණි. මෙබඳු සංවිධානයන්හි උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් වශයෙන් 1921 වර්ෂයේ දී ලංකාව සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවා දීමට යටත් විජිත රජය කටයුතු කළේ ය. කොළඹ තර්ස්ටන් පාරේ (වර්තමාන මුනිදාස කුමාරතුංග මාවත) ගොඩනැගිල්ලක පිහිටුවන ලද ලංකා විශ්වවිද්‍යාල කොලීජිය (Ceylon University College) යන එම ආයතනය ස්වාධීන විශ්වවිද්‍යාලයක් නො ව ලන්ඩන් විශ්වවිද්‍යාලය යටතේ පැවති අනුබද්ධිත ආයතනයක් විය. එහි ශාස්ත්‍ර (කලා) විෂයයන් මෙන් ම විද්‍යා විෂයය ද ඇතුළත් විය. ඉන් ප්‍රදානය කෙරුණු උපාධි ලන්ඩන් විශ්වවිද්‍යාල උපාධි වූයේ ය.

ස්වාධීන ලංකා විශ්වවිද්‍යාලය ඒකීය වූ ද නේවාසික වූ ද ආයතනයක් විය යුතු බවට එකඟතාවක් යටත් විජිත පාලනයත් විශ්වවිද්‍යාල ව්‍යාපාරයේ අයත් අතර ස්ථාපනය විය. මීළඟට පැන නැගුණු ප්‍රශ්නය වූයේ එම ආයතනය කොතැන පිහිටුවිය යුතු ද යන්න ය. මේ ගැන දීර්ඝ විවාදයක් සිදු විය. ඇතැමුන් එය පරිපාලන කේන්ද්‍රය වූ කොළඹ පිහිටුවිය යුතු යැයි කියා සිටි අතර අන්‍යයන් කියා සිටියේ අග නගරයේ කාර්යබහුල පරිසරයෙන් මිදුණු ශාස්ත්‍ර ගවේෂණය සඳහා සුවදායක පරිසරයක් ඇති මහනුවර ප්‍රදේශයේ එය පිහිටුවිය යුතු බව ය. වසර ගණනාවක් තිස්සේ දිගින් දිගට සිදු වූ මේ විවාදය 1928 වන විට අවසන් වූයේ 'එය මහනුවර ප්‍රදේශයේ පිහිටුවිය යුතු ය' යන තීරණයෙනි.

යෝජිත ලංකා විශ්වවිද්‍යාලය සඳහා සැලසුමක් ඉදිරිපත් කිරීම සඳහා රජය විසින් 1928 දී එවකට මහා බ්‍රිතාන්‍යයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති වූ ශ්‍රීමත් වෝල්ටර් බුකැනන්-රිඩ්ල් මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලදි. එහි වාර්තාව 1929 දී නිකුත් විය. බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල සැලසුම් පදනම් කර ගත් ඒ වාර්තාව මගින් යෝජිත ලංකා විශ්වවිද්‍යාලයේ ව්‍යූහය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කොට තිබිණි.

මහනුවර ප්‍රදේශයේ කුමන ස්ථානයක එය පිහිටුවිය යුතු ද යන්න ගැන නිශ්චිත තීරණයක් ගනු ලැබුවේ 1938 වර්ෂයේ දී ය. පළමුව අදහස වූයේ එය දුම්බර මිටියාවතේ පිහිටුවිය යුතු ය යනුවෙනි. අරුප්පල භූමි ප්‍රදේශයක් ද ඒ සඳහා හඳුනා ගෙන තිබිණි. එහෙත් එම ප්‍රදේශය මැලේරියා වසංගතය පැවති ප්‍රදේශයක් බවත් එහි තවදුරටත් ප්‍රසාරණය සඳහා

ඉඩ කඩ මඳ බවත් පෙන්වා දුන් පිරිසක් වඩාත් සුදුසු ස්ථානය ලෙස යෝජනා කළේ පේරාදෙණියේ තේ හා රබර් වතු භූමියකි. හන්තාන කඳුවැටියෙන් ඇරඹී මහවැලි ගඟ වෙත දිවෙන බෑවුමකින් යුත් මේ භූමිය යෝජිත ලංකා විශ්වවිද්‍යාලය සඳහා සුදුසුතම භූමිය බව රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් 1938 සැප්තැම්බර් 30 දින තීරණය කරන ලදි.

යෝජිත ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවාලීමේ භාරධූර කර්තව්‍යයෙහි වගකීම පැවරිය හැකි අධ්‍යාපනඥයකු මහා බ්‍රිතාන්‍යයේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතරින් සොයා බැලූ යටත් විජිත බලධාරීහු, එවකට ලන්ඩන්හි කීර්තිමත් විශ්වවිද්‍යාල ආයතනයක් ලෙස පැවති ලන්ඩන් ආර්ථික විද්‍යා ශාස්ත්‍රාලයෙහි (London School of Economics- LSE) ප්‍රාචාර්ය පදවියක් හොබවමින් සිටි විලියම් අයිවර් ජෙනිංග්ස් මහතා ඒ සඳහා තෝරා ගත්හ.

අයිවර් ජෙනිංග්ස් මහතා ලන්ඩන් ආර්ථික විද්‍යා ශාස්ත්‍රාලයට බඳවා ගෙන තිබුණේ 1929 වර්ෂයේ දී ය. එහි දී ඔහුගේ විශිෂ්ට උගැන්වීම් හා පර්යේෂණ ඇගයූ එම ආයතනය විසින් 1930 දී ප්‍රාචාර්ය පදවියට උසස් වීමක් ලබා දෙන ලදි. ජෙනිංග්ස් මහතා එල්. එස්. ඊ. ආයතනයට ඒමට පෙර එංගලන්තයේ ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ කථිකාචාර්ය පදවියක් දරමින් සිටියේ ය. ඔහු උපත ලබා තිබුණේ 1903 වර්ෂයේ දී උතුරු එංගලන්තයේ බ්‍රිස්ටල් නුවර ය. ඔහුගේ පියා වඩු කාර්මිකයෙකි. තම ළමා වියේ දී දිළිඳුකමින් පීඩා විඳි ජෙනිංග්ස් මහතාට අධ්‍යාපනයෙන් ඉහළට නැගීමට උපකාරී වූයේ එවකට දක්ෂ දරුවන්ට අධ්‍යාපන අවස්ථා ලබා දීමට සැකසී තිබුණු ශිෂ්‍යාධාර ක්‍රමය ය. ඒ අනුව බ්‍රිස්ටල්හි පාසලක ද්විතීයික අධ්‍යාපනය ලද ඔහුට සිය දක්ෂතා අනුව සුප්‍රකට කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙහි අධ්‍යාපනය ලැබීම පිණිස ශිෂ්‍යත්වයක් ලැබිණි. එහි දී ගණිතය විෂයයෙන් මෙන් ම නීතිය විෂයයෙන් ද ප්‍රථම පන්ති සාමර්ථ්‍යය ලැබීමට ඔහුට හැකි විණි. 1925 වර්ෂයේ සිට උතුරු එංගලන්තයේ ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය පදවියක් දැරූ ඔහු 1929 දී කේම්බ්‍රිජ් සරසවියෙන් බැරිස්ටර් උපාධිය ද ලබා ගති.

ජෙනිංග්ස් මහතා ලංකාවේ පැවැති යුනිවර්සිටි කොලීජි ආයතනයේ ප්‍රධානාචාර්ය ලෙස පත් කළ රජය, එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමේ කාර්යය එතුමා වෙත පැවරී ය. 1940 දී දෙවන ලෝක මහා සංග්‍රාමය ඇරඹීම නිසා ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමේ කර්තව්‍යයට බාධා සිදු විණි. එය භාර වූ ජෙනිංග්ස් මහතාට එදා තිබුණු ප්‍රධාන ගමනාගමන මාර්ගය වූ නැව් මඟින් ලක්දිවට ඒමට වසරක් පමණ කල් බලා සිටින්නට සිදු විය. ඒ අතරතුර රජය විසින් යෝජිත විශ්වවිද්‍යාල භූමිය වූ පේරාදෙණිය වතුයායේ භූමිය තුළ විශ්වවිද්‍යාල ගොඩනැගිලි ස්ථාපනය කළ යුතු ආකාරය සඳහා භූමි සැලැස්මක් සම්පාදනය කිරීමේ කාර්යය එංගලන්තයේ සිටි විශිෂ්ට වාස්තු විද්‍යාඥයකු වූ පැට්රික් ඇබර්ක්‍රොම්බි මහතා වෙත පවරා තිබිණි. 1941 වර්ෂයේ මාර්තු මස අග භාගයේ දී අයිවර් ජෙනිංග්ස් මහතා ලක්දිවට පැමිණෙන විට එම බිම් සැලැස්ම සම්පාදනය වී තිබුණේ ය.

ලක්දිවට සපැමිණි ජෙනිංග්ස් මහතා යුනිවර්සිටි කොලීජියේ ප්‍රධානාචාර්ය පදවිය භාර ගෙන එහි කටයුතු කරමින් තමන් වෙත පැවරී තිබුණු විශ්වවිද්‍යාල පිහිටුවීමේ කර්තව්‍යයට අදාළ ලිපිගොනු පරීක්ෂා කළේ ය. යෝජිත නව විශ්වවිද්‍යාල මහනුවර සමීපයේ පේරාදෙණියෙහි පිහිටුවීමට තීරණය වී ඇති අතර එම භූමියේ ගොඩනැගිලි සැලසුම් විය යුතු ආකාරය පිළිබඳ මූලික සැලැස්ම ද සම්පාදිත බැව් ඔහුට පෙනිණි. අප්‍රේල් මස මුල් සතියේ ලැබුණු මහ සිකුරාදා නිවාඩු දිනයේ ඔහු පේරාදෙණියට ගියේ තමා පිහිටුවන නව

විශ්වවිද්‍යාලය කොතැන විය යුතු ද යන්න ගැන අදහසක් ලබා ගැනීම පිණිස ය. ඔහු තම චරිතාපදානයේ මෙසේ ලියා ඇත: "පරණ ගලහ පාර දිගේ රිය පදවා ගෙන ගිය මම (වත්මන් සනාතන මන්දිර ගොඩනැගිල්ල පිහිටා ඇති) උස් තැනිතලාව වෙත පැමිණියෙමි. රියෙන් බැස වැඩෙමින් තිබූ කැළෑව මැදින් ඉහළට නැගුණු මම එහි වූ ගස් කොටයක හිඳගෙන ශ්‍රීමත් පැට්රික් ඇබර්ක්රොම්බි මහතා විසින් සැලසුම් කළ භූමි සිතියම දිගහැර ගත්තෙමි. යෝජනා ක්‍රමයේ උත්කෘෂ්ටාලංකාරය මා ඉදිරියේ මැවී පෙනෙන්නට වූයේ එවිට ය. ඒ ගැන කිසිදු සැකයක් නැත. මෙය ශ්‍රේෂ්ඨ විශ්වවිද්‍යාලයක් වනවා ඇත." (*Road to Peradeniya*, p.178) පේරාදෙණි සරසවි භූමිය ලෝකයේ විශිෂ්ටතම සරසවි නිකේතනයක් බවට පත් කිරීම සඳහා ජෙනිංග්ස් මහතා මහත් කැපවීමකින් කටයුතු කළ බව පෙනේ. මූලික භූමි සැලැස්ම සම්පාදනය කිරීමෙන් පසුව ගොඩනැගිලි සැලසුම් කිරීම සඳහා 'විශ්වවිද්‍යාල වාස්තු විද්‍යාඥ' පදවියක් ඇති කොට ඊට අතිදක්ෂ ශ්‍රී ලාංකේය වාස්තු විද්‍යාඥයකු වූ ෂර්ලි ද අල්විස් මහතා පත් කරනු ලැබී ය. චිරාගත සිංහල ගෘහ නිර්මාණ ශිල්පයෙහි විවිධාංග එක්තැන් කරමින් ඔහු විසින් සැලසුම් කරන ලද ගොඩනැගිලි අසහාය වාස්තු විද්‍යාත්මක නිර්මාණ ලෙස මහත් අගයකින් යුතුව සරසවි බිම පුරා විසිරී පවතී. 1940 දශකයේ දී ඇරඹී 1950 දශකයේ දී නිමා වූ එම ගොඩනැගිලි දේශීය වාස්තු විද්‍යාත්මක අනන්‍යතාව ලොවට හඬ ගා කියන සිහිවටන ලෙස ඉතිහාසයට එක් වී ඇත. බ්‍රිතාන්‍ය ජාතිකයකු වුව ද ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මේ ගොඩනැගිලිවල කලාත්මකභාවය මහත් සේ අගය කළේ ය.





ඔහු කොළඹ සිටිය ද හැකි සෑම විටක ම පේරාදෙණියට පැමිණෙමින් ගොඩනැගිලි ඉදි වන අයුරු නිරීක්ෂණය කළා පමණක් නො ව විශ්වවිද්‍යාල භූමිය අලංකරණය කිරීම සඳහා සුදුසු තුරුලතා අලුතින් රෝපණය කිරීමට ද පියවර ගත්තේ ය. නුවරින් පිහිටි රාජකීය උද්භිද උද්‍යානයේ පාලකවරයාගේ සහයෝගය ගෙන වසරේ කලින් කල සුපුෂ්පිත වන තුරුලතා තෝරා ගෙන ඒවා රෝපණය කරවූ ජෙනිංග්ස් මහතා අවසන සරසවි බිම අලංකාර ගොඩනැගිලිවලින් පමණක් නො ව කලාත්මක පරිසරයකින් ද හෙබි ස්ථානයක් බවට පත් කිරීමට වෙහෙස ගත්තේ ය.

තම චරිතාපදානයේ ඔහු මෙසේ සඳහන් කර තිබේ:

> "මා නිරතව සිටි කර්තව්‍යය වන විශ්වවිද්‍යාලයක් ගොඩනැංවීම කිසියම් අයෙකුට භාරදිය හැකි වටිනා ම කර්තව්‍යයක් වේ. ඒ නිසා එය මට උදේ 9 සිට සවස 4 දක්වා කළ රැකියාවක් වූයේ නැත. එය ඇතැම් විට සවස 4 සිට රෑ 9 දක්වා වූයේ ය. තවත් ඇතැම් විටෙක රෑ 9 සිට පසුවදා උදේ 4 දක්වා වූයේ ය."

මේ කියමනෙන් පෙනෙන්නේ ජෙනිංග්ස් මහතා දිවා රෑ නො බලා විශ්වවිද්‍යාලය පිහිටුවාලීමේ කටයුත්තෙහි නිරත වූ ආකාරය ය. නව විශ්වවිද්‍යාලය සඳහා එහි ව්‍යුහය, පීඨවලට බෙදා ලීම, ආචාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ඔවුන්ගේ උසස් වීම් පටිපාටි, ශිෂ්‍යයන් බඳවා ගැනීම, ප්‍රවේශ විභාග පැවැත්වීම හා උපාධි පාඨමාලා සැකසීම ආදි දහසක් දේ ඔහුගේ මූලිකත්වයෙන් සිදු විය. ඒ අවධියෙහි විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය පවත්වන ලද්දේ විශ්වවිද්‍යාලය විසින් ම බව මෙහි දී සඳහන් කළ යුතුව ඇත. විශ්වවිද්‍යාලය අභ්‍යන්තර වශයෙන් සංවිධානය කිරීමට අමතරව එය ලෝකයේ අන්‍ය විශ්වවිද්‍යාල විසින් පිළිගනු ලබන ආයතනයක් බවට පත් කිරීම ද සිදු කළ යුතුව තිබිණි. ජෙනිංග්ස් මහතාට මහා බ්‍රිතාන්‍යයේ මෙන් ම අන්තර්ජාතිකව අධ්‍යාපනඥයකු වශයෙන් වූ පිළිගැනීම, ලංකා විශ්වවිද්‍යාලයට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීම සඳහා මහෝපකාරී වූයේ ය.

ස්වාධීන විශ්වවිද්‍යාලය සඳහා නීති සම්පාදනය කිරීමෙන් පසු 1942 ජූලි 1 දින එවකට යුනිවර්සිටි කොලීජිය ආයතනයේ කාර්යාලය පිහිටුවා තිබූ තර්ස්ටන් පාරේ (වර්තමාන කුමාරතුංග මුනිදාස මාවතේ) කොලේජ් හවුස් නම් ගොඩනැගිල්ලේ ඉහළ මාලයෙහි කොඩි ගසක ස්වාධීන ලංකා විශ්වවිද්‍යාල ධජය ජෙනිංග්ස් මහතා විසින් නැංවීමෙන් ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමේ සිද්ධිය සංකේතාත්මකව සිදු විය. ඉන් පසු විශ්වවිද්‍යාලයේ කටයුතු මනාව පවත්වා ගෙන යන අතර යෝජිත පරිදි එය පේරාදෙණියේ ඉදි වෙමින් පැවති නව ගොඩනැගිලි වෙත ගෙන යැමට ජෙනිංග්ස් මහතා සැලසුම් කළේ ය.

පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලය නේවාසික විශ්වවිද්‍යාලයක් විය යුතු යැයි තීරණය වී තිබුණු හෙයින් ඒ සඳහා අපේක්ෂිත 500ක පමණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නේවාසික අවශ්‍යතා සපුරා ලීම පිණිස නේවාසිකාගාර ගණනාවක් සරසවි බිමෙහි තැනින් තැන ඉදි වෙමින් පැවතිණි. ජාතික සම්ප්‍රදායට ගෞරව කරමින් එක් මුල් කාන්තා නේවාසිකාගාරයක් 'සංඝමිත්තා ශාලාව' යැයි නම් විය. එක් පිරිමි නේවාසිකාගාරයක් යුනිවර්සිටි කොලීජියේ පළමු ප්‍රධානාචාර්ය රොබට් මාර්ස් මහතා සිහි කරනු වස් 'මාර්ස් ශාලාව' ලෙස නම්

කෙරිණි. විසි වන සියවසේ ජාතික නිදහස් අරගලයේ පුරෝගාමීන් සිහිපත් කරමින් ජයතිලක ශාලාව, අරුණාචලම් ශාලාව, රාමනාදන් ශාලාව, ජේම්ස් පීරිස් ශාලාව ආදිය නම් කොට තිබිණි. විශ්වවිද්‍යාලය සඳහා මහත් ධන පරිත්‍යාගයක් කළ හිල්ඩා ඔබේසේකර මැතිනිය නමින් ද ශාලාවක් නම් කෙරිණි. මේ නේවාසිකාගාරවල කටයුතු සංවිධානය කරනු පිණිස නීති රීති මාලාවක් ද ජෙනිංග්ස් මහතා විසින් සම්පාදනය කරන ලදි. නේවාසික විශ්වවිද්‍යාලයක් පිහිටුවා ලීමේ අරමුණ වූයේ නිරන්තරව ආචාර්ය ශිෂ්‍ය සම්බන්ධතා මගින් හුදෙක් පන්ති කාමරවල සිදු කෙරෙන ශාස්ත්‍ර ගවේෂණයට හා අධ්‍යාපනයට අමතරව සාකච්ඡා හා සම්මන්ත්‍රණ ආදියෙන් ඥානය වර්ධනයටත් සාහිත්‍ය, සංගීත, නාට්‍ය ආදි කලා කටයුතු ප්‍රවර්ධනයටත් ඉඩ සලසන පරිසරයක් සකසා දීම ය. පසුව සිංහල සාහිත්‍යයේත්, නාට්‍ය කලාවේත් විශිෂ්ට නිර්මාණ බිහි වීමටත් ජාත්‍යන්තර වශයෙන් පවා සම්මානයට පාත්‍ර වූ ශාස්ත්‍ර ගවේෂණ හා ප්‍රකාශන එළි දැක්වීමටත් පදනම වැටුණේ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්ගේ පුරෝගාමිත්වයෙන් ක්‍රියාත්මක වූ නේවාසික විශ්වවිද්‍යාල සංකල්පය බැව් කිව හැකි ය. ලංකා විශ්වවිද්‍යාලයේ කටයුතු ගණනාවකට ඔහු පුරෝගාමිත්වය සැපයුවේ ය. දක්ෂ එහෙත් ආර්ථික අගහිඟකම් ඇති ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හිමි කර දීමේ අරමුණින් ශිෂ්‍යත්ව ක්‍රමයක් පිහිටුවීමට ඔහු පියවර ගත්තේ ය. විශ්වවිද්‍යාල කලා කටයුතු සංවිධානය කිරීම පිණිස කලා මණ්ඩලයක් පිහිටුවා ඒ සඳහා උනන්දුව සිටි ආචාර්යවරුන්ට එහි කටයුතු භාර කළේ ය. විශ්වවිද්‍යාලය සඳහා චිත්‍ර ප්‍රදර්ශනාගාරයක් සහිත කෞතුකාගාරයක් සැලසුම් කළ ඔහු, එය සඳහා ප්‍රථම පියවර ලෙස සුප්‍රකට චිත්‍ර ශිල්පී ජෝර්ජ් කීට්ගේ 'පූජාව' නම් චිත්‍රය මිලයට ගැනීමට කටයුතු කළේ ය. එම කෞතුකාගාරය තව ම ඉදි වී නැතත් චිත්‍රය විශ්වවිද්‍යාල පුස්තකාලයේ ප්‍රදර්ශනය වී තිබේ.

ජෙනිංග්ස්ගේ මෙහෙවර විශ්වවිද්‍යාලයට සීමා වූයේ නො වේ. 1948 දී ලංකාව නිදහස ලබන අවස්ථාවේ ඒ නිදහස් රාජ්‍යය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ කර්තව්‍යය බ්‍රිතාන්‍ය රජයේ මෙන් ම ශ්‍රී ලාංකික දේශපාලන නායකයන්ගේ එකඟතාවෙන් අයිවර් ජෙනිංග්ස් මහතා වෙත පැවරිණි. 1948 නිදහස ලැබූ දා සිට 1972 නව ජනරජ ව්‍යවස්ථාවක් ස්ථාපනය වන තෙක් මෙරට පාලනය වූයේ ජෙනිංග්ස් විසින් සම්පාදනය කර දෙන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව ය. ඔහුගේ එම දක්ෂතාව හඳුනා ගත් නව නිදහස් රාජ්‍ය කිහිපයක එනම්, පකිස්ථානය, මැලේසියාව, ඝානාව, ගයානාව, නේපාලය සහ මාලදිවයින රාජ්‍යයන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය වූයේ ඔහුගේ උපදෙස් අනුව ය.

කාර්යබහුල ජීවිතයක් ගත කළ නමුත් ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් සිය දැනුම ලෝකයා වෙත ප්‍රදානය කරනු සඳහා ග්‍රන්ථ ගණනාවක් ලියා පළ කිරීමට සමත් විය. *The Law and the Constitution* (නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව), *Cabinet Government* (කැබිනට් රාජ්‍ය පාලනය), *Parliament* (පාර්ලිමේන්තුව), *The Commonwealth in Asia* (ආසියාවේ පොදු රාජ්‍ය මණ්ඩලය), *Nationalism, Colonialism and Neutralism* (ජාතිකවාදය, යටත්විජිත වාදය හා මධ්‍යස්ථවාදය), *The Constitutional Laws of the Commonwealth* (පොදුරාජ්‍ය මණ්ඩලයේ ව්‍යවස්ථා නීති), *Approach to Self-Government* (ස්වයං පාලනයට ප්‍රවේශය) ආදිය ඉන් සමහරකි.

ජෙනිංග්ස් මහතා 1941 ලක්දිවට පැමිණියේ මෙරටට විශ්වවිද්‍යාලයක් ගොඩ නගා දී වසර පහකින් ආපසු එංගලන්තයට යැමේ අදහසිනි. එහෙත් මෙහි කටයුතුවල දිගින් දිගට නිරත වූ ඔහුට 1955 වන තෙක් ම වසර 14ක් පමණ මෙහි රැඳී සිටීමට සිදු විය. ලක්දිවෙන් එංගලන්තයට ගිය ඔහු වෙත ඔහුගේ ගුරු භූමිය වූ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය විසින් එහි ට්‍රිනිටි හෝල් ආයතනයෙහි ප්‍රධානත්වය (Master) පවරන ලදි. ඔහු මිය යන තුරු ම එම පදවිය දැරුවේ ය. යළි 1961 සිට කේම්බ්‍රිජ් සරසවියේ උපකුලපති පදවිය 1963 තෙක් දැරූ ඔහු වෙත නීතිය පිළිබඳ ඩව්නිං මහාචාර්ය පදවිය ද පිරිනැමිණි. 1965 දෙසැම්බර් 19 වන දින ඔහු මිය යන තුරු ම සරසවි සේවයේ යෙදී සිටියේ ය. රැජිනගේ නීතිඥ (Queens Counsel) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ නයිට් පදවිය (KBE) ආදි ගෞරවනාම මෙන් ම ලංකා විශ්වවිද්‍යාලය ඇතුළු විශ්වවිද්‍යාල ගණනාවකින් සම්මාන ආචාර්ය උපාධි ද ඔහුට පිරිනැමිණි. ජෙනිංග්ස් මහතාගේ චරිතය අධ්‍යයනය කළ විද්වතුන්ගේ මතය වන්නේ ඔහු තම ජීවිත කාලය තුළ බොහෝ කටයුතු ඉටු කර තිබුණත් තමා අතින් ඉටු වූ විශිෂ්ටතම මෙහෙවර වූයේ පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවා ලීම යැයි සැලකූ බව ය. ස්වචරිතාපදානයක් (autobiography) ලියා තැබූ ඔහු එය නම් කළේ **පේරාදෙණියට මාවත** (*The Road to Peradeniya*) යනුවෙනි. ඔහු මිය යන විට අමුද්‍රිතව තිබුණු මෙම පොත සංස්කරණය කොට 2005 වසරේ දී මුද්‍රණය කරවන ලදි.

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් අගය කළ සාරධර්ම කෙබඳු වී ද යන්න විදහාපාන සිද්ධියක් ඔහුගේ වැඩිමහලු දියණිය වූ ක්ලෙයාර් මහත්මිය විසින් සඳහන් කර තිබේ. ඔහුගේ කාර්යබහුල ජීවිතය නිසා තම දූවරුන් දෙදෙනාගේ අධ්‍යාපනයට බාධා සිදු විය. බාල දියණිය වූ ෂර්ලි, මෙල්බර්න් සරසවියෙන් උපාධියක් ලැබූ මුත් ක්ලෙයාර්ට ඒ වරම නො ලැබිණි. පසුව ලක්දිවට පැමිණ පුවත්පත් කලාවේදිනියක ලෙස කටයුතු කළ ඇ, තම පියා උපකුලපති වූ ලංකා විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට අපේක්ෂා කළා ය. එහෙත් පියාගේ ප්‍රතිචාරය වූයේ ‘ඔබ බුද්ධිමත් මදි’ (You are not intelligent enough) යන්න ය. පෙරළා එංගලන්තයට ගිය පසු ක්ලෙයාර් මහත්මිය එහි දී උසස් පෙළ විභාගය සමත්ව කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ම ඇතුළු වී 1965 දී පියා මිය යෑමට සමසකට පෙර උපාධිය ලැබුවා ය. මේ සිද්ධියෙන් පිළිබිඹුව ඇත්තේ ප්‍රතිපත්තිගරුක පියකුගේ සහ නො පසුබස්නා ධෛර්යය ඇති දුවකගේ කථාව ය.

## අවබෝධය

1. **දේශපාලනික වශයෙන් අයිවර් ජෙනිංග්ස්ගෙන් සිදු වූ සේවය කුමක් ද?**
2. **ජෙනිංග්ස්ට අධ්‍යාපනයෙන් ඉහළ ම තැනට ඒමට හැකි වූයේ කුමක් නිසා ද?**
3. **විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා ජෙනිංග්ස් දිවා රෑ වෙහෙසුණු බැව් දැක්වෙන ප්‍රකාශය උපුටා දක්වන්න.**
4. **මෙහි දැක්වෙන පරිදි නේවාසික විශ්වවිද්‍යාල සංකල්පය මගින් අපේක්ෂිත අරමුණු මොනවා ද?**
5. **අයිවර් ජෙනිංග්ස් ග්‍රන්ථ සම්පාදනය කර ඇත්තේ කිනම් විෂය ක්ෂේත්‍රයකට අදාළව ද?**


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන වචනවලට ගැළපෙන විරුද්ධාර්ථ පද පාඩමෙන් උපුටා ලියන්න.

i. විවේකී -
ii. සංකෝචනය -
iii. පරාධීන -
iv. අවිශිෂ්ට -
v. දේශීය -
vi. බාහිර -
vii. අවිද්‍යාත්මක -
viii. අනපේක්ෂිත -
ix. පසුබස්නා -
x. අවමාන -

2. පහත දැක්වෙන පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කරන්න.

i. විද්වතුන් -
ii. ආයතනයක් -
iii. ව්‍යාපාරයේ -
iv. දරුවන්ට -
v. විශ්වවිද්‍යාලයක් -
vi. විද්‍යාඥයකු -
vii. ගවේෂණයට -
viii. ප්‍රදර්ශනය -
ix. සිද්ධියෙන් -
x. ගොඩනැගිල්ලෙහි -

3. පහත දී ඇති පද විසන්ධි කොට දක්වන්න.

i. ශාස්ත්‍රාලයෙහි -
ii. ශිෂ්‍යාධාර -
iii. කථිකාචාර්ය -
iv. ගමනාගමන -
v. උත්කෘෂ්ටාලංකාර -
vi. ප්‍රධානාචාර්ය -
vii. විවිධාංග -
viii. චරිතාපදානය -
ix. නේවාසිකාගාරය -
x. ගෞරවාදරය -

4. මුලින් දැක්වෙන ව්‍යාකරණ වර්ගයට අයත් නො වන පද තෝරන්න.

i. තද්ධිත නාම - ජාතික, ප්‍රධානත්වය, කර්තව්‍ය, ව්‍යූහය
ii. කෘදන්ත නාම - ආයතන, සැලසුම්, ගොඩනැගිලි, තිබුණු
iii. නිපාත පද - නමුත්, හෙබි, සඳහා, විසින්
iv. උපසර්ග සහිත පද - සිහිවටන, පරිවර්තනය, ප්‍රවර්ධනය, ප්‍රතිචාර
v. සර්ව නාම පද - ඔහු, මම, ඔවුන්, ජනයා

5. පහත දී ඇති තද්ධිත පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කරන්න.

i. දියණි -
ii. විශිෂ්ටතම -
iii. ශිෂ්‍යත්ව -
iv. අනන්‍යතා -
v. ආර්ථික -
vi. රාජකීය -
vii. කාර්මික -
viii. ශිල්පී -
ix. නූතන -
x. ද්විතීයික -

6. පහත දැක්වෙන පදවල උපසර්ග වෙන් කොට දක්වන්න.

i. ප්‍රතිඵල -
ii. පරිපාලන -
iii. පිළිගැනීම -
iv. සම්පාදනය -
v. අතිදක්ෂ -
vi. නිරීක්ෂණය -
vii. සුපුෂ්පිත -
viii. ප්‍රවර්ධනය -
ix. අමුද්‍රිත -
x. උපකුලපති -

7. පහත දැක්වෙන වචන යොදා වාක්‍යය බැගින් ලියන්න.

i. පුරෝගාමීහු -
ii. සුවදායක -
iii. ජාත්‍යන්තර -
iv. භාරධුර -
v. සංග්‍රාමය -
vi. නිකේතන -
vii. සුප්‍රකට -
viii. කලාත්මක -
ix. ශ්‍රේෂ්ඨ -
x. ප්‍රතිපත්තිගරුක -

## ප්‍රායෝගික අභ්‍යාස

1. ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ චරිතයට අදාළ කරුණු පහත දැක්වෙන අනුමාතෘකා ඔස්සේ පෙළගස්වන්න.

i. ජීවන තොරතුරු හා අධ්‍යාපනය
ii. ශාස්ත්‍රීය මෙහෙවර
iii. අපේ රටට සිදු කළ මෙහෙය
iv. චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ